# සැඟවුණු බටු පැළය



දිහන්සා සෙතුනි ඉලංගරත්න

# සැගවුණු බටු පැළය

**ISBN No**

**978-624-211-242-8**

**කතෘගෙ වෙනත් කෘති :**

**බුද්ධිමත් කුරුල්ලො (2023)**
**සමගිව සිටිමු(2024)**

**කෘතිය පළ කරණ දිනය :**

**2026.10.06**

# සැගවුණු බටු පැළය

කතෘ
දිහන්සා සෙතුනි ඉලංගරත්න

සිතුවම්
දිහන්සා සෙතුනී ඉලංගරත්න

කතෘගෙ වෙනත් කෘති : බුද්ධිමත් කුරුල්ලො (2023)
: සමගිව සිටිමු (2024)

කෘතිය පල කරණ දිනය : 2026.10.06

# පිදුම

පුංචි මල් කැකුළු වන්

අපගේ අනාගතය

යහපත් කරන්නට වෙරදරන

මහාමායා විදුහල් මෑණියන්ට

මහත් හද බැතියෙන්

මෙම පොත පුද කරමි



# පෙරවදන


දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

2026-10-06



අපිට ලස්සන ගෙවත්තක් තිබුණා.ඒකේ එළවළු පැළ, පලතුරු පැළ, පලා වර්ග ගොඩාක් තිබුණා.

මම හැමදාම පැළ වලට වතුර දැම්මා.





අම්මයි මමයි ගෙවත්තේ ඇවිදින කොට අම්මා කීවා “බටු ගෙඩි හැදෙන්නෙ බටු මල් වලින් කියලා”. මම එදා ඉඳලා බටු පැළයක් දිහා හැමදාම බැලුවා.


දම්පාට පුංචි බටු මල්
ඇවිල්ලා ටිකෙන් ටික ඒවා
ලොකු වුණා.




දැන් බටු මල් බටු ගෙඩි
වෙන්න ළඟයි



ඒ කාලය එක දිගටම වහින්න පටන් ගත්තා. වැස්ස නවතින්නේම නැ. මුළු පරිසරයම කළුවරයි.




එක දවසක් උදේම මම ගෙවත්තට ගියා. අනේ අපේ ගෙවත්ත නාය ගිහින්. එක පැළයක්වත් නෑ. බවු පැළයත් නෑ.




බටු පැළය ඇත පස් කන්දකට යටවෙලා. මට හරිම දුකයි.



දුකෙන් කාලය ගත වුණා. වැස්ස නැවතුනා. දින කීපයකින් ඇත පස් අතරින් බටු පැළය ආපහු දලු දාලා මතුවෙනවා.



මට ආපහු බටු ගෙඩි හැදෙන හැටි බලන්න පුළුවන්. මට ගොඩාක් සතුටුයි.



# ස්තූතිය

කතන්දර පොතක් ලියන්න කියා මාව දිරිමත්

කළ මාගේ ආදරණීය ගුරු මැණියන්ටත්,

මම කතන්දරය කියන විට එය ලියූ

මාගේ ආදරණීය අම්මාටත්,

කතන්දරය අසා සතුටු වූණ

මාගේ ආදරණීය අප්පච්චීටත්, අයියා සහ නංගීටත්,

දහසකුත් වැඩ මැද මාගේ මෙම කතන්දරය

ටයිප් කර සකසා දුන්

මාගෙ නැන්දට සහ මාමාටත්

මාගෙ හද පිරි ප්‍රණාමය පුද කර සිටිමි.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිළමෙ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No
978-624-211-242-8